# 6. අප උදෙසා දිවි පිදූ ජේසුස් වහන්සේ

**දෙවියන් වහන්සේ තම ස්වරූපයෙන් ම මවන ලද මුල් මනුෂ්‍යයා උන්වහන්සේට අකීකරු ව පාපය වැලඳ ගත්තේ ය. පැරණි යුදෙව් සමාජය තම පාපයට කමාව ලැබීම උදෙසා අනුගමනය කළ පිළිවෙත වූයේ පාස්කු දින දෙවිඳුන්ට බැටළුවෙකු පූජා කිරීම යි. එම බැටළුවාගේ ලෙය කරුණකොට ගෙන ඔව්හු තම පාපයට කමාව අපේක්ෂා කළෝය. නමුත් ජේසුස් වහන්සේ තම ජීවිතය කුරුසිය මත පූජා කිරීමෙන් වගුරන ලද රුධිරය කරුණකොට ගෙන මනුෂ්‍යා පාපයෙන් මුදවා ගත් සේක. මෙසේ දෙවියන් වහන්සේගෙන් වෙන් ව ගිය මිනිසාට නැවත දේව සබඳතාවය ගොඩ නැංවීමට මාර්ගය පහදා දුන් සේක. එම පූජා වීම අද අපි අධ්‍යයනය කරමු.**

'මහ සිකුරාදා" දිනය සැමරුම වෙනුවෙන් විශේෂ වැඩ සටහනක් පාසලේ ක්‍රිස්තියානි සංගමය විසින් සංවිධානය කර තිබුණි. විශාල ලී කුරුසියක් ශාලාවේ මේසය මත තබා තිබුණි. ක්‍රිස්තියානි ධර්මය විෂය භාර ගුරුතුමියගේ ප්‍රධානත්වයෙන් වැඩ සටහන ආරම්භ විය.


ගුරුතුමියː අද විශේෂයෙන් විමසා බලන්නට යන්නේ ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම පිළිබඳව යි. ඒ ගැන ඔබටත් අදහසක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න.

නයෝමිː අපේ පව් නිසා, ජේසුස් වහන්සේ කුරුසියක් මත ජීවිතය පූජා කළා.

සලෝමිː උන්වහන්සේගේ හිසට කටු ඔටුන්නක් දැමුවා. උන්වහන්සේට කස පහර දුන්නා. අපහාස කළා.

ගුරුතුමියː ඔව්, ඔබ දෙදෙනාම ප්‍රකාශ කළේ සත්‍යයක්. දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ අතර දේව කැමැත්තට අනුව ඔවුන් ජීවත් වේ යැයි බලාපොරොත්තු වුණා. එහෙත් මිනිසා දේව කැමැත්තට පිටුපා කටයුතු කළා. මෙසේ දෙවියන් වහන්සේගෙන් ඈත් වුණ මිනිසා, නැවත තමන් වෙතට සමීප කර ගන්නට උන්වහන්සේ විවිධ ආකාරයට කටයුතු කළා. අවසානයේ දී තම එකම පුත් ජේසුස් වහන්සේ අප වෙනුවෙන් එවනු

ලැබුවා. අපගේ ගැලවීම උදෙසා කටයුතු කිරීම නිසා උන්වහන්සේට කුරුසිය මත බොහෝ වධ වේදනා විඳ දිවි පිදීමට සිදු වුණා. අප මහ සිකුරාදා දින සිහිපත් කරන්නේ එම දුක්බර සිදුවීම යි. අපි ඒ පිළිබඳ ව දේව වචනය කියවා බලමු.




**ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම පිළිබඳ විශේෂ අවස්ථා විමසා බලමු.**

ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබුවේ හෙබ්‍රෙව් බසින් ගොල්ගොතා යයි නම් කළ කපාලපිටිය නම් ස්ථානයේ ය. සොරු දෙදෙනෙක්, එක් කෙනෙක් දකුණු පසෙහි ද එක් කෙනෙක් වම් පසෙහි ද උන්වහන්සේ හා සමග කුරුසියේ ඇණ ගසනු ලැබූ හ. උන්වහන්සේට අදාළ ව කුරුසිය මත සටහන් කළ ප්‍රකාශය වූයේ **"ජුදෙව්වන්ගේ රජ"** යන්න ය.

එදා සිදු වූ දේ ලෝක ඉතිහාසය තුළ කිසි දිනක අමතක කළ නොහැකි ඉතා කණගාටුදායක සිදු වීමක්. අපි දැන් එය මතෙව්තුමාගේ ශුභාරංචියට අනුව පිළිවෙළින් අධ්‍යයනය කරමු.



6.1 රූපය - ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන යාම

ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන කපාලපිටිය යන අර්ථය ඇති ගොල්ගොතා ස්ථානයට පැමිණි සේක.



6.2 රූපය - ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට කිරේනියේ සීමොන් උපකාර කිරීම

ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට කිරේනියේ සීමොන් නම් පුද්ගලයාට බලකරනු ලැබූ අතර ඔහු ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට උපකාරී විය.




6.3 රූපය - ජේසුස් වහන්සේගේ ඇඳුම් දාදු දැමීම

ජේසුස් වහන්සේගේ හිසට ඉහළින් චෝදනා පත්‍රය ලියා තිබුණි. එහි ලියා තිබුණේ **"මොහු ජුදෙව්වන්ගේ රජ ජේසුස්"** යන්නයි. එසේම උන්වහන්සේ කුරුසියේ ඇණ ගැසූ පසු ව කුරුසිය පාමුල දී ම උන්වහන්සේගේ ඇඳුම් දාදු දමා බෙදා ගත් හ.



6.1 රූපය - ජේසුස් වහන්සේ කුරුසිය මත දිවි පිදීම

උන්වහන්සේට දෙපසින් සොරුන් දෙදෙනකු ඇණ ගැසූ අතර එක් සොරකු එතුමාණන්ට නින්දා කළ හ. නායක පූජකයන්, ප්‍රජා මූලිකයන් හා විනයධරයන් ද කුරුසිය පාමුල සිට උන් වහන්සේට කවටකම් කළ හ.

මද්දහනේ සිට අපර භාග තුන දක්වා තද අන්ධකාරයක් පහළ විය. ''ඒලී ඒලී ලාමා සබක්තානි" යයි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක. (අර්ථය - මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද) ජේසුස් වහන්සේ මහත් හඬින් හඬ නගා අප වෙනුවෙන් කල්වරියේ දිවි පිදූ සේක.

එදා ජේසුස් වහන්සේ මෙලෙස නින්දා අපහාස මැද ඉතා දුක් විඳ රුදු කුරුසිය මත දිවි පිදුවේ උන්වහන්සේගේ කිසිදු වරදක් නිසා නොවේ. පව්කාර වූ මිනිසා වෙනුවෙන් පෙනී සිටීම නිසා ය. උන්වහන්සේ කුරුසිය මත දී දෙවියන් වහන්සේගෙන් මනුෂ්‍යයාගේ පාපයට කමාව ඉල්ලූ සේක. (ලූක් 3:34) එසේ කළේ දෙවියන් වහන්සේට අකීකරු වී උන්වහන්සේගෙන් ඈත් ව සිටින අපට එම පාපයෙන් ගැලවීම ලබා දීම උදෙසා ය.

**"දේව මාලිගය කඩා දමා**
**එය තුන් දවසකින් ගොඩ නගන ඔබ,**
**ඔබ ම ගලවා ගන්න"**
**ශු. මතෙව් 27:40**

ඉහත වදන් ජේසුස් වහන්සේට අපහාස කරමින් පැවසූ වදන් විය. නමුත් ජේසුස් වහන්සේ පෙර කළ එම වදන් තුළින් ප්‍රකාශ කළේ කුරුසිපත් ව, තෙදිනකින් සිදු වන තමන් වහන්සේගේ උත්ථානය සම්බන්ධ ව ය.

**"ඔහු අනුන් ගැළෙව්වේ ය. දැන් තමාට ම ගැළවෙන්ට නුපුළුවන"**

**ශු. මතෙව් 27:42**

ජේසුස් වහන්සේ කුරුසිය මත පූජා වූයේ ජනතාව පාපයෙන් ගළවා ගැනීම උදෙසා ය.

**ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ රජ නොවේ ද?**

**එසේ නම් දැන් කුරුසියෙන් බසීවා.**

**එවිට අපි ඔහු විශ්වාස කරන්නෙමු."**

**ශු. මතෙව් 27:42**

හාස්කමක් මගින් කුරුසියෙන් නොබසින්නේ මන්ද යන්න පිළිබඳ ව සලකා බැලීමේ දී අප විශ්වාස කළ යුත්තේ ජේසුස් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය කරණකොට ගෙන ජනතාවට උරුම වන සදාතන ජීවනය ය.

තමන් ව නිර්මාණය කළ දෙවිඳුන්ට අකීකරු ව උන්වහන්සේගේ කැමැත්තට එරෙහි ව මිනිසා බොහෝ විට කටයුතු කරයි. එම ක්‍රියා හේතුකොට ගෙන දෙවියන් වහන්සේ සමග තිබෙන සම්බන්ධතාවයෙන් මිනිසා ඉවත් වෙමින් එය කඩා බිඳ දමයි. ජේසුස් වහන්සේ මෙම බිඳුණු සම්බන්ධතාවය නැවත ගොඩ නගන්නට තම දිවි කල්වරියේ කුරුසිය මත පූජා කළ සේක.

ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම මුළු ලෝකයටම නව බලාපොරොත්තුවක් ලබා දෙන්නකි. මිනිසාට තනිව පාපයෙන් ජය ගත නොහැකි ය. අපගේ පාපය වෙනුවෙන් අප ලැබිය යුතු දඬුවම උන්වහන්සේ විසින් විඳ දරාගෙන අපව ඒ දඬුවමෙන් නිදහස් කළ සේක. මෙලෙස උන්වහන්සේ තම මෙහෙවර සම්පූර්ණ කළ සේක.

එම නිසා අපගේ ගැලවීම උදෙසා උන්වහන්සේගේ දිවි පිදීම ගැන තුති පුදමින්, කුරුසිය පාමුල අපගේ ජීවිතවල වැරදි නිවැරදි කර ගනිමින්, උන්වහන්සේට අයිති දරුවන් මෙන් ක්‍රියා කරමු.

**කටපාඩම් කරමු.**

**යෙසායා 53 : 6**

ක්‍රියාකාරකම

1. ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට අදාළ විශේෂ අවස්ථා පෙළ ගස්වන්න.